සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2019 ජනවාරි

## (AA35) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය

(Corporate and Personal Taxation)

2019-01-27
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට අනුව "තැනැත්තා" (Person) යන වචනයට සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් (body of persons) හෝ යම් ආණ්ඩුවක් ඇතුලත් වේ."

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) "පුද්ගල මණ්ඩලයක්" යන පදය යටතේ ඇතුලත් කළ හැකි තැනැත්තන් තිදෙනෙක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) ශ්‍රී ලංකාවේ ප්‍රධාන බදු අධිකාරීන් (tax authorities) දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

**සීමාසහිත සාගරි (පෞද්ගලික) සමාගම,** 2017 ජූලි 01 වන දින සංස්ථාපනය කළ අතර, එදිනම එහි ව්‍යාපාර කටයුතු ද ආරම්භ කරන ලදි. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාගම ගිණුම්කරණ අලාභයක් දරා තිබූ අතර, බදු අයකළ හැකි ආදායමක් ද එහි නොතිබුණි.

සමාගමේ අධ්‍යක්ෂවරුන් පහත සඳහන් දෑ සම්බන්ධයෙන් ඔබගෙන් උපදෙස් පතයි:

- සමාගම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම.
- 2017/18 තක්සේරු වර්ෂය සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් කිරීම.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් එක් එක් අවස්ථාව සඳහා දේශීය ආදායම් පනත යටතේ අදාල වන ප්‍රතිපාදන **සඳහන් කරන්න.** (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

(A) **සරත්** වාසික පුද්ගලයෙකි. 2017/18 තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම, සේවා නියුක්ති ආදායමෙන් සහ ස්ථාවර තැන්පතු මත ලද පොලී ආදායමෙන් සමන්විත වේ. තවද, ඔහුගේ සේවා නියුක්ති ආදායම මත සේවායෝජකයා විසින් උපයනවිට ගෙවීමේ බදු (PAYE) අඩුකර ඇති අතර, ස්ථාවර තැන්පතුවලින් ලැබුණු පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු [withholding tax (WHT)] අඩුකර තිබුණි. 2017/18 තක්සේරු වර්ෂය සඳහා ඔහුට වෙනත් ආදායම් කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සරත්** විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, ආදායම් වාර්තාව ගොනු (file) කිරීම අවශ්‍ය වන්නේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(B) "යම් තක්සේරු වර්ෂයක් තුළදී නිශ්චිත නියමයන් පහකින් (05) ඕනෑම නියමයන් හතරක් (04) සපුරාලන ඕනෑම පුද්ගලයෙකු එම නියමයන් සැපිරීමෙන් පසු මාසයක් ගතවීමට පෙර, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ආදායම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය."

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත සඳහන් ආකාරයට අනුව ආදායම් වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සම්පූර්ණ කළයුතු නිශ්චිත වූ නියමයන්ගෙන් ඕනෑම දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**සීමාසහිත හෙල්ත්කෙයා (පෞද්ගලික) සමාගම,** ඖෂධ ව්‍යාපාරයක නියැලී සිටින අතර, සහෝදරයන් තිදෙනෙකු විසින් එය කළමනාකරණය කරනු ලබයි. එදිනෙදා ව්‍යාපාර මෙහෙයුම් සඳහා සක්‍රියව දායකවන කළමනාකරණ අධ්‍යක්ෂක වන **ඩයස් මහතාට** වෛද්‍ය ප්‍රතිකාරයක් සඳහා විදේශ ගතවීමට සිදුවිය. එමනිසා අනෙක් සහෝදරයන් දෙදෙනා විසින් **ඩයස් මහතා** සමාගමේ දියුණුව සඳහා කරන ලද අතිවිශේෂ සේවාව සැලකිල්ලට ගනිමින් ඔහුගේ වෛද්‍ය වියදම් පියවා ගැනීම සඳහා සමාගමෙන් විශේෂ ප්‍රසාද දීමනාවක් ප්‍රදානය කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයා විසින් සමාගමෙන් ලැබුණු ප්‍රසාද දීමනාව **ඩයස් මහතාගේ** සේවා නියුක්ති ආදායමේ කොටසක් වශයෙන් තක්සේරු කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

"ක්‍රිබ් එදිරිව දේශීය ආදායම් බදු කොමසාරිස් (Crib vs. Commissioner of Income Tax) නඩුවේ තීන්දුව ඇසුරින්, වෛද්‍ය ප්‍රතිකාර සඳහා සමාගමෙන් ලැබුණු ප්‍රසාද දීමනාව බදු අරමුණු සඳහා **ඩයස් මහතාගේ** සේවා නියුක්ත ආදායමේ කොටසක් ලෙස සැලකිය හැකිදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 05 වන ප්‍රශ්නය

විශ්‍රාමික ගුරුවරියක වන **පැතුමි**, 2014 ජනවාරි මාසයේදී පැළ තවාන් ව්‍යාපාරයක් ආරම්භ කළාය. 2016 දී **පැතුමිගේ** යෙහෙළියක වන **සිතුමි** හවුල්කරුවෙකු වශයෙන් ව්‍යාපාරයට සම්බන්ධ වූ අතර, **සිතු පැතු ග්‍රෝවර්ස්** නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ලාභා'ලාභ පිළිවෙලින් 2:1 අනුපාතයට බෙදා ගැනීමට **පැතුමි** සහ **සිතුමි** එකඟ වූහ.

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය පහත දැක්වේ:

| | **රු.** |
|---|---|
| දළ ලාභය | 12,426,000 |
| එකතු කළා: වෙනත් ආදායම් | |
| ඉතිරිකිරීමේ ගිණුම මත පොලී ආදායම - දළ {රඳවාගැනීමේ බදු [withholding tax (WHT)] අඩුකර නැත} | 7,500 |
| | **12,433,500** |
| වියදම්: | |
| වැටුප් | (3,800,000) |
| වත්කම් මත ක්ෂය | (432,000) |
| විදුලිය, ජලය සහ දුරකතන | (144,500) |
| **සිතුමි** විසින් දෙනලද ණය මුදල මත පොලිය | (45,000) |
| ලිපිද්‍රව්‍ය | (14,000) |
| **ශුද්ධ ලාභය** | **7,998,000** |

පහත දැක්වෙන අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වැටුප්වල පහත දෑ ඇතුලත් වේ:

- වාර්ෂික වැටුප වශයෙන් **පැතුමිට** ගෙවන ලද රු.720,000/- ක්.
- හවුල් ව්‍යාපාරයේ පොත් තැබීම වෙනුවෙන් **සිතුමිගේ** දුවට ගෙවන ලද රු.500,000/- ක්.

(2) **සිතු පැතු ග්‍රෝවර්ස්** වෙත ලබාදුන් ණයමුදල වෙනුවෙන් **සිතුමිට** පොලිය ගෙවා ඇත.

(3) 2017/18 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු වෙනුවෙන් වත්කම් මත ක්ෂය දීමනාව රු.168,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාරයේ බෙදිය හැකි ලාභය **ගණනය කරන්න.** (ලකුණු 04)

(b) හවුල් ව්‍යාපාරයේ ආදායම් බදු වගකීම **ගණනය කරන්න.** (ලකුණු 03)

(c) හවුල් ව්‍යාපාරයෙන් පැන නගින ලාභ සහ වෙනත් ආදායම් හවුල්කරුවන් අතර බෙදාහැරීමේ ප්‍රකාශනයක් **පිළියෙල කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත ඇවොටෙල් ටෙක්නොලොජීස් සමාගම,** එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වූ සමාගමක් වන අතර, පරිගණක ආනයනය කර විකිණීම, මෘදුකාංග සංවර්ධනය සහ වෙනත් සම්බන්ධිත සේවා සැපයීම යන ව්‍යාපාරයන්හි නිරත වී සිටියි.

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත සඳහන් තොරතුරු සමාගමේ පොත්වලින් උපුටාගෙන ඇත:

(1) ආදායම (එකතු කළ අගය මත බදු රහිතව):

| | රු. |
|---|---|
| පරිගණක විකිණීම | 5,200,000 |
| ජාල රැහැන්ගත කිරීම සහ ස්ථාපිත කිරීම (Network cabling and installation) | 3,900,000 |
| සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) සඳහා ලියාපදිංචි පුද්ගලයන්ට සපයන ලද නඩත්තු සේවා | 1,350,000 |
| ඉන්දියාවේ භාවිතය සඳහා විදේශීය ගැනුම්කරුවෙකුට සංවර්ධනය කර දුන් මෘදුකාංගයක් වෙනුවෙන් උපයන ලද විදේශීය ව්‍යවහාර මුදල් ආදායම [ඇමරිකානු ඩොලර් (USD) 1 = රු.150/-] | 4,000,000 |
| **එකතුව** | **14,450,000** |

(2) සමාගම විසින් ගෙවන ලද යෙදවුම් බදු (Input VAT):

| | රු. |
|---|---|
| ආනයනය කළ ජාල කේබල් මත | 320,000 |
| විකුණූ පරිගණක යාපනයට ප්‍රවාහනය කිරීම මත ගෙවූ යෙදවුම් බදු | 17,000 |

(3) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද අතිරික්ත යෙදවුම් බද්ද රු.52,000/- කි.

(4) සරල කරන ලද එකතුකළ අගය මත බදු විකුණුම් වෙනුවෙන් SVAT බැර වවුචර් පත් [Simplified VAT Credit Vouchers (SVCV)] සමාගමට ලැබී තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි / (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද (VAT) **තක්සේරු කරන්න**. (ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

ප්‍රධාන ව්‍යාපාර කටයුත්ත ලෙස සෙරමික් නිෂ්පාදිත (ceramic products) නිෂ්පාදනය කර විකිණීමේ නිරතව සිටින **සුනිමල් එන්ටප්‍රයිසස්,** ආනයනය කරන ලද නිත්ත සහ වෙනත් ගෙඩනැගිලි ද්‍රව්‍ය, තොග සහ සිල්ලර වෙළඳාමේද නිරතව සිටී. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා **සුනිමල් එන්ටප්‍රයිසස් හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදි:

(1) සමාගමේ විකුණුම් පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| සමාගම විසින් නිෂ්පාදනය කළ සෙරමික් නිෂ්පාදිත විකිණීමෙන් | 4,360,000 |
| සමාගම විසින් ආනයනය කළ නිත්ත සහ වෙනත් ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමෙන් | 5,200,000 |
| **එකතුව** | **9,560,000** |

(2) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ස්ථාවර තැන්පතුවලින් ලද පොලී ආදායම රු.250,000/- කි.

(3) සමාගම විසින් ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බදු [Nation Building Tax (NBT)] පහත පරිදි වේ:

| | රු. |
|---|---|
| සෙරමික් නිෂ්පාදිත නිෂ්පාදනය සඳහා ආනයනය කළ යන්ත්‍ර මත | 140,000 |
| සෙරමික් නිෂ්පාදිත නිෂ්පාදනය සඳහා ආනයනය කළ අමුද්‍රව්‍ය මත | 62,000 |
| ආනයනය කළ නිත්ත සහ වෙනත් ගොඩනැගිලි ද්‍රව්‍ය මත | 22,000 |

(4) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ජාතිය ගොඩනැගීමේ බදු මාසික වාරික ලෙස රු.25,000/- ක් ගෙවා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි ජාතිය ගොඩනැගීමේ බද්ද **තක්සේරු කරන්න**. (ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

අනිවාර්ය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

**සීමාසහිත මාලිගා කන්ස්ට්‍රක්ෂන්ස් (පෞද්ගලික) සමාගම** ඉදිකිරීම් කර්මාන්තයේ නිරතව සිටින වාසික සමාගමකි. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගම විසින් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘති කිහිපයක් සිදුකරන ලදී. 2018 මාර්තු 31 දිනට, සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සහ මුළු සංචිත, පිළිවෙලින්, රු.20,000,000/- ක් සහ රු.5,000,000/- ක් විය.

පහත සඳහන් තොරතුරු **සීමාසහිත මාලිගා කන්ස්ට්‍රක්ෂන්ස් (පෞද්ගලික) සමාගමෙහි** මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලදී:

(1) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ පිරිවැටුම සහ ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් රු.876,400,000/- ක් සහ රු.16,250,000/- ක් විය.

(2) වෙනත් ආදායම්, පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:

| | **රු.** |
|---|---:|
| බැංකුව විසින් රඳවාගැනීමේ බද්ද [Withholding Tax (WHT)] අඩුකර තිබෙන ස්ථාවර තැන්පතු මත පොළී ආදායම | 240,000 |
| ලැයිස්තුගත ණයකර මත පොළී ආදායම (2016 අගෝස්තු මාසයේදී ආයෝජනය කරන ලද) | 1,456,000 |
| රක්ෂණ වන්දි | 300,000 |
| **එකතුව** | **1,996,000** |

(3) පහත සඳහන් වියදම් ද ඇතුළුව, සියලුම වියදම් අය කිරීමෙන් පසු, ශුද්ධ ලාභය ගණනය කර තිබුණි:

| | **රු.** |
|---|---:|
| ක්ෂය කිරීම් | 5,028,000 |
| සංග්‍රහ වියදම් | 134,000 |
| විදේශ ගමන් වියදම් **(01 වන සටහන)** | 474,000 |
| දඩ **(02 වන සටහන)** | 1,903,600 |
| පරිත්‍යාග **(03 වන සටහන)** | 1,250,000 |
| නීති සහ උපදේශන ගාස්තු **(04 වන සටහන)** | 115,000 |
| මාධ්‍ය ප්‍රචාරණය | 765,000 |
| පාරිතෝෂික **(05 වන සටහන)** | 8,500,000 |
| කල්බදු පොලිය | 60,750 |
| පරිපාලක සමාගමට ගෙවූ පොලිය **(06 වන සටහන)** | 3,000,200 |

**01 වන සටහන - විදේශ ගමන් වියදම්**:

- නව යන්ත්‍රයක් පරීක්ෂා කිරීම සඳහා ප්‍රධාන විධායක නිලධාරියාගේ විදේශගත වීම වෙනුවෙන් ගුවන් ටිකට්පත් පිරිවැය රු.120,000/- කි.
- අපේක්ෂිත ව්‍යාපෘතියක් පිළිබඳ සාකච්ඡා කිරීම (negotiations) සඳහා සමාගමේ ප්‍රධාන ඉංජිනේරුවරයා මාලදිවයිනට යවන ලදී. සංචාරයේ පිරිවැය රු.354,000/- ක් විය.
- 2016/17 තක්සේරු වර්ෂය සඳහා වෙළඳාමෙන් ලද ව්‍යවස්ථාපිත ආදායම රු.14,880,000/- කි.

**02 වන සටහන - දඩ**:

| | රු. |
|---|---|
| තක්සේරුවක් මත ගෙවූ අතිරේක බද්ද | 1,276,000 |
| අතිරේක බද්ද මත දඩය | 127,600 |
| ප්‍රමාදවී නිමකිරීම මත ගෙවූ ඇවර කළ අලාභ (liquidated damages) | 500,000 |

**03 වන සටහන - පරිත්‍යාග**:

| | රු. |
|---|---|
| අනුමත පුණ්‍යායතනයක් වන ළමා නිවාසයකට කළ මුදල් පරිත්‍යාග | 1,000,000 |
| කාර්යමණ්ඩලයේ දරුවන් සඳහා ශිෂ්‍යාධාර | 250,000 |

**04 වන සටහන - නීති සහ උපදේශන ගාස්තු**:

| | රු. |
|---|---|
| බදු තක්සේරුව අවසන් කිරීම සඳහා ගාස්තු | 65,000 |
| බදු වාර්තාව ගොනුකිරීම සඳහා ගාස්තු | 50,000 |

**05 වන සටහන - පාරිතෝෂික**:

2018 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සිදුකරන ලද පාරිතෝෂික ප්‍රතිපාදනය, පාරිතෝෂික මගින් දැක්වෙන අතර ප්‍රවර්තන වර්ෂය තුලදී පාරිතෝෂික ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි.

**06 වන සටහන - පරිපාලක සමාගමට ගෙවූ පොලිය**:

සමාගම එහි පරිපාලක සමාගම වන **සීමාසහිත ඊසී ලයිෆ් පොදු සමාගම** වෙතින් රු.112,000,000/- ක ණය මුදලක් ලබාගෙන තිබේ. සමාගම එහි පරිපාලක සමාගම වෙතින් ලබාගත් මෙම ණය මුදල මත පොලිය වශයෙන් රු.3,000,200/- ක් වර්ෂය තුලදී ගෙවා ඇත.

(4) දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තර පහත දැක්වේ:

**පිරිවැය**

| **වත්කම්** | **2017 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.)** | **එකතු කිරීම් (රු.)** | **ඉවත්කිරීම් (රු.)** | **2018 මාර්තු 31 දිනට ශේෂය (රු.)** |
|---|---|---|---|---|
| ඉඩම | 8,000,000 | - | - | 8,000,000 |
| ගොඩනැගිලි | 2,500,000 | - | - | 2,500,000 |
| යන්ත්‍රෝපකරණ | 25,670,000 | 3,450,000 | - | 29,120,000 |
| මෝටර් වාහන | 10,450,000 | - | 2,400,000 | 8,050,000 |
| කාර්යාල උපකරණ | 1,546,000 | 348,000 | - | 1,894,000 |
| පරිගණක - කල්බදු මත | - | 800,000 | - | 800,000 |
| **එකතුව** | **48,166,000** | **4,598,000** | **2,400,000** | **50,364,000** |

**ක්ෂය වීම්**

| **වත්කම්** | **2017 අප්‍රේල් 01 දිනට ශේෂය (රු.)** | **වර්ෂය සඳහා අයකිරීම (රු.)** | **ඉවත්කිරීම් (රු.)** | **2018 මාර්තු 31 දිනට ශේෂය (රු.)** |
|---|---|---|---|---|
| ගොඩනැගිලි | 1,000,000 | 125,000 | - | 1,125,000 |
| යන්ත්‍රෝපකරණ | 15,402,000 | 3,080,400 | - | 18,482,400 |
| මෝටර් වාහන | 4,702,500 | 1,149,500 | 2,400,000 | 3,452,000 |
| කාර්යාල උපකරණ | 463,800 | 162,500 | - | 626,300 |
| පරිගණක - කල්බදු මත | - | 192,000 | | 192,000 |
| **එකතුව** | **21,568,300** | **4,709,400** | **2,400,000** | **23,877,700** |

- ව්‍යාපෘතියක භාවිත කළ ට්‍රක් රථයක් 2017 දෙසැම්බර් මාසයේදී අනතුරකට ලක්වූ අතර, එය සම්පූර්ණයෙන්ම හානියට පත් විය (fully condemned). රක්ෂණ වන්දිය වශයෙන් රු.300,000/- ක් රක්ෂණ සමාගමෙන් ගෙවන ලද අතර, එය වෙනත් ආදායම් යටතේ වාර්තා කර තිබේ. මෙම ට්‍රක් රථය මිලදීගෙන ඇත්තේ 2013/14 තක්සේරු වර්ෂයේදීය.
- එකක් රු.160,000/- ක් බැගින් පිරිවැය වන ලැප්ටොප් පරිගණක 5 ක්, 2017 ජූනි 01 දින සිට ආරම්භ වන මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ අත්පත් කරගන්නා ලද අතර, කල්බදු කාලය මාස 30 කි. මාසික කල්බදු වාරිකය රු.45,000/- ක් වන අතර, ප්‍රවර්තන වර්ෂය තුළදී වාරික 10 ක් ගෙවා තිබුණි.
- වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, 2017 අප්‍රේල් 01 දිනට පැවති සියලු දේපළ, පිරියත සහ උපකරණ බදු අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි.

(5) 2017/18 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු [Economic Service Charge (ESC)] ගෙවීම් රු.4,382,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017/18 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **තක්සේරු කරන්න**:

(a) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(b) තක්සේරු කළ හැකි ආදායම,

(c) බදු අයකළ හැකි ආදායම,

(d) ගෙවිය යුතු දළ ආදායම් බද්ද, සහ,

(e) ගෙවිය යුතු ඉතිරි බද්ද.

***සැ.යු:*** *යම් වියදමක් ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.* (ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

**සිල්වා මහත්මිය** අවුරුදු 64 වියැතිය. වරලත් ගණකාධිකාරීවරියක වන ඇය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ සංචාරක නියෝජිත සමාගමක් වන **සීමාසහිත ජ්සී ටුවර් (පෞද්ගලික) සමාගමේ** මූල්‍ය අධ්‍යක්ෂවරිය ලෙස සේවය කරයි. 2017/18 තක්සේරු වර්ෂය (මින්මතු 'වර්ෂය' යැයි හැඳින්වෙන) සඳහා **සිල්වා මහත්මිය** සම්බන්ධව පහත සඳහන් තොරතුරු සපයා ඇත:

(1) වර්ෂය තුළදී ඇයට සමාගමෙන් පහත සඳහන් දෑ ලැබී තිබේ:

- දළ වැටුප - මසකට රු.240,000/- බැගින්.
- ඇගේ පෞද්ගලික සහ රාජකාරී භාවිතය වෙනුවෙන් (එන්ජින් ධාරිතාවය 2,000 CC වන) මෝටර් රථයක් ඉන්ධන සහ රියැදුරු සමඟ සමාගම ඇය වෙත සපයා ඇති අතර, පෞද්ගලික භාවිතය වෙනුවෙන් ඇය සේවායෝජකයාට ගෙවීමක් කර නොමැත. සමාගම, මෙම මෝටර් රථය වෙනුවෙන් ධාවන වාර්තා පවත්වා නොගනී.
- වර්ෂය තුළදී සංචාරක නියෝජිත සංගමය මගින් ඩුබායිහිදී පවත්වන ලද සමුළුවකට ඇය සහභාගී වූ අතර, ගුවන් ටිකට්පතේ පිරිවැය සහ නවාතැන් ගාස්තුව වූ රු.720,000/- ක් සමාගම විසින් දරණ ලදී.
- වර්ෂයට අදාල රු.291,000/- ක් වූ ඇයගේ දුරකතන බිල්පත්, සමාගම විසින් ඇයට වර්ෂය තුළදී ප්‍රතිපූර්ණය කරන ලදී.

(2) **සීමාසහිත ඊසී ටූවර් (පෞද්ගලික) සමාගමේ** පරිපාලිත සමාගමක් විසින් මාසයකට රු.84,000/- ක (බදු අඩුකළ පසු) අධ්‍යක්ෂක ගාස්තුවක් ඇයට ගෙවා ඇත. එම අධ්‍යක්ෂක ගාස්තුව මත අදාල බදු අඩු කර ඇති බව ඇයට දැනුම් දී ඇති අතර, පරිපාලිත සමාගමේ සේවකයෙකු ලෙස ඇයව සළකා නොතිබුණි.

(3) **සිල්වා මහත්මිය** ජීවත් වන්නේ 2017 මැයි මාසයේදී මිලට ගත් රොස්මීඩ් පෙදෙසෙහි පිහිටි ඇගේම තට්ටු නිවාසයකය. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.1,500,000/- ක් වන අතර, 30% බැගින් වූ වරිපනම් ගෙවා තිබුණි.

(4) ඇගේ දෙමාපියන්ගෙන් උරුම වූ නිවසක් ඇයට මහනුවර තිබෙන අතර, 2018 ජනවාරි මාසයේ සිට ඇගේ සහෝදරයා එම නිවසේ වාසය කරයි. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.120,000/- ක් වන අතර, 20% බැගින් වරිපනම් ගෙවා ඇත. ඇගේ සහෝදරයා එම නිවසේ පදිංචිවීමට පෙර 2017 දෙසැම්බර් දක්වා රු.100,000/- ක මාසික කුලියකට එම නිවස අසල්වැසියෙකුට කුලියට දී තිබුණි.

(5) **සිල්වා මහත්මියට** රු.5,200,000/- ක ස්ථාවර තැන්පතුවක් මහජන බැංකුවේ තිබෙන අතර, වර්ෂය තුළදී ඇයට රු.420,000/- ක පොලියක් ඉන් ලැබී තිබේ. බැංකුව විසින් මෙම පොලී ආදායම මත රඳවාගැනීමේ බදු [Withholding Tax (WHT)] අඩුකර නොමැත.

(6) වර්ෂය තුළදී ඇය ලංකා බැංකුවෙන් රු.5,500,000/- ක නිවාස ණයක් ලබාගෙන තිබෙන අතර, එම මුදල් රොස්මීඩ් පෙදෙසේ තට්ටු නිවාසය මිළදී ගැනීමට ආයෝජනය කර තිබේ. මෙම ණය මුදල සඳහා පොලිය සහ ප්‍රාග්ධන ආපසු ගෙවීම වශයෙන් වර්ෂය තුළදී පිළිවෙලින් රු.304,000/- ක් සහ රු.280,000/- ක් ඇය විසින් ගෙවා ඇත.

(7) අතරමං වූ දරුවන් (abandoned children) වෙනුවෙන් රැකවරණය සලසන අනුමත ළමා නිවාසයකට ඇය විසින් වර්ෂය තුළදී රු.90,000/- ක් පරිත්‍යාග කර තිබේ.

(8) **සීමාසහිත ඊසී ටූවර් (පෞද්ගලික) සමාගම** විසින් වර්ෂය සඳහා අඩුකළ උපයන විට ගෙවීමේ බද්ද (PAYE) රු.200,000/- කි.

(9) වර්ෂය තුළදී, ස්ව-තක්සේරු පදනම මත ඇය විසින් රු.25,000/- ක ආදායම් බද්දක් ගෙවා තිබේ.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

2017/18 තක්සේරු වර්ෂය සඳහා **සිල්වා මහත්මියගේ** පහත සඳහන් දෑ **තක්සේරු කරන්න:**

(a) බදු අයකළ හැකි ආදායම,

(b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද,

(c) ගෙවිය යුතු ඉතිරි බද්ද, සහ,

(d) බදු නිදහස් ආදායම (වේ නම්). (ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැළකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැළැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |